# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2021 අගෝස්තු

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය

දුරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ජාතික පාරිභෝගික මිල දර්ශකය මාසිකව නිකුත් කරනු ලබන අතර, 2021 අගෝස්තු මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය (Headline Inflation) 6.7%ක් බව එහි අධ්‍යක්ෂ ජනරාල් මෙම නිවේදනය නිකුත් කරමින් සඳහන් කර ඇත. පසුගිය ජූලි මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 6.8%ක් ලෙස වාර්තා විය. 2021 අගෝස්තු මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 5.1%ක හා ආහාර නොවන කාණ්ඩයේ 1.7%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. එහෙත් 2020 අගෝස්තු මාසයේ 6.2%ක්වූ මතුපිට උද්ධමනයට ආහාර කාණ්ඩයේ දායකත්වය 5.7%ක් හා ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය 0.6%ක් විය. 2020 අගෝස්තු මාසයට සාපේක්ෂව 2021 අගෝස්තු මාසයේ ආහාර කාණ්ඩයේ ප්‍රතිශතය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ සහල්, එළවළු, පොල්තෙල්, පොල්, මයිසූර් පරිප්පු සහ ලොකු ළූණු යන ආහාර ද්‍රව්‍යවල පැවති ඉහළ මිල මට්ටම් ය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2021 ජූලි මාසයේ 146.6ක් වූ දර්ශකාංකය 2021 අගෝස්තු මාසයේ 147.1ක් දක්වා වැඩිවීමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කලවිට 2021 අගෝස්තු මාසයේ දර්ශකාංකය 0.5ක වැඩිවීමක් එනම් 0.3ක ප්‍රතිශතකාංක වැඩිවීමක් වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ දර්ශක අගය 0.25%කින් වැඩිවීම සහ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය 0.11%කින් වැඩිවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩය සැළකුවිට සීනි, අර්තාපල්, අළුත් මාළු, මයිසූර් පරිප්පු, කුකුළ් මස්, කරවල, පළතුරු, බිස්කට්, බිත්තර, ටින් මාළු, කහ කුඩු, තිරිඟු පිටි, සෝයා මීට්, තුනපහ කුඩු, සහ මිරිස් කුඩු යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීමක් වාර්තා විය. කෙසේ වෙතත් සහල්, පොල්තෙල්, පොල්, රතු ළූණු සහ අමු මිරිස් යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2021 අගෝස්තු මාසයේ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය වැඩිවීම සඳහා ‘මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය' (පුවක්), ‘රෙදිපිළි හා පාවහන්", 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු', 'සෞඛ්‍ය' (පෞද්ගලික රෝහල් කාමර ගාස්තු) සහ 'ආපනශාලා සහ හෝටල්' යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිල වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. තවද 'විනෝදාත්මක හා සංස්කෘතික' සහ ‘විවිධ භාණ්ඩ හා සේවා' යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ සුළු මිල වැඩිවීමක් වාර්තා වී ඇත. එසේ වුවත් පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන' (LP ගෑස්) යන කාණ්ඩයේ මිල අඩුවීමක් වාර්තා වී ඇත. 'ප්‍රවාහන', 'සන්නිවේදන' සහ 'අධ්‍යාපන' යන කාණ්ඩවල මිල දර්ශක අගය වෙනසක් වී නොමැත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ ලක්ෂ්‍යමය වෙනස්වීම් පදනම්ව නිතර මිල උච්චාවචනය වන ආහාර වර්ග, බලශක්ති සහ ප්‍රවාහන අයිතමයන් ඉවත් කිරීමෙන් පිළිඹිබු වන යටිදැරි උද්ධමනය (Core Inflation) 2021 ජූලි මාසයේ 4.4% සිට 2021 අගෝස්තු මාසයේ 4.7% දක්වා වැඩිවීමක් වාර්තා විය.

**ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම: 2013=100), ජාතික පාරිභෝගික මිල දර්ශකය (යටිදැරි), ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය සහ ලක්ෂ්‍යමය යටිදැරි උද්ධමනයේ විචලනය**




**ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)**

| වර්ෂය | මාසය | දර්ශකාංකය | | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | | ලක්ෂ්‍යමය උද්ධමනය (%) | |
|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) |
| 2020 | අගෝ. | 137.8 | 139.9 | 0.4 | 0.4 | 6.2 | 4.6 |
| | සැප්. | 138.9 | 140.4 | 0.8 | 0.4 | 6.4 | 4.8 |
| | ඔක්. | 139.1 | 140.5 | 0.1 | 0.1 | 5.5 | 4.5 |
| | නොවැ. | 139.8 | 140.6 | 0.5 | 0.1 | 5.2 | 4.5 |
| | දෙසැ. | 141.2 | 140.5 | 1.0 | -0.1 | 4.6 | 4.7 |
| 2021 | ජන. | 142.1 | 141.0 | 0.6 | 0.4 | 3.7 | 4.2 |
| | පෙබ. | 142.8 | 141.3 | 0.5 | 0.2 | 4.2 | 4.1 |
| | මාර්තු | 142.1 | 141.8 | -0.5 | 0.4 | 5.1 | 4.3 |
| | අප්‍රේල් | 142.2 | 142.5 | 0.1 | 0.5 | 5.5 | 4.1 |
| | මැයි | 143.6 | 143.7 | 1.0 | 0.8 | 6.1 | 4.2 |
| | ජූනි | 145.7 | 144.6 | 1.5 | 0.6 | 6.1 | 4.1 |
| | ජූලි | 146.6 | 145.6 | 0.6 | 0.7 | 6.8 | 4.4 |
| | අගෝ. | 147.1 | 146.5 | 0.3 | 0.6 | 6.7 | 4.7 |

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව